# ආර්ථික දුෂ්කරතා නේවාසිකාගාරගත විද්‍යාර්ථීන්ට බලපෑම් කරන ආකාරය විමර්ශනය කිරීම: ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ඇසුරින්

*බී. එම්. එල්. එස්. කේ. බස්නායක*[1]

විවිධ ප්‍රදේශවලින් විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුළත් වන අතර නේවාසිකාගාර තුළ රැඳී සිටිමින් අධ්‍යයන කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් ඔවුනට හිමි වේ. නේවාසික ව රැඳී සිටීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ නේවාසිකාගාරගත විද්‍යාර්ථීන්ට ආර්ථික දුෂ්කරතා බලපෑම් කරන්නේ කෙසේ ද යන ප්‍රධාන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දුටුගැමුණු පිරිමි නේවාසිකාගාරයේ සිසුන් 25ක් සහ ඥානම් ගැහැනු නේවාසිකාගාරයේ සිසුන් 60ක් ලෙස සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන් අසූපස් දෙනෙක් පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබූහ. ගූගල් පෝරමයක් හරහා ලබාගත් ප්‍රතිචාර මත දත්ත ලබා ගන්නා ලදී. ආර්ථික දුෂ්කරතා නේවාසිකාගාර ගත විද්‍යාර්ථීන්ට බලපෑම් කරන්නේ කෙසේ දැයි හඳුනා ගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. උපඅරමුණු අතර ආර්ථික අපහසුතා අධ්‍යාපන කටයුතුවලට බලපෑම් කරන්නේ කෙසේ ද ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ නේවාසිකාගාරගත විද්‍යාර්ථීන් තුළ ගැටලු නිරාකරණයට පවතින විසඳුම් කෙබඳු දැයි හඳුනා ගැනීම ඇතුළත් විය. මෙහි දී නේවාසික ව රැඳී සිටින සිසුන් බහුතරයක් ආර්ථික අපහසුතා හේතුවෙන් පීඩාවට පත් වන බව අනාවරණය විය. බහුතරයක් සිසුන්ගේ පියා පමණක් රැකියාවක් සිදු කරනු ලබයි. 56 දෙනෙක් නේවාසිකාගාරගත ව අධ්‍යාපන කටයුතු සිදු කිරීමට අවශ්‍ය මුදල් පවුලේ අය සහ ශිෂ්‍යාධාර හරහා ලබා ගනිති. මාසික වියදම සඳහා රුපියල් 10000 - 20000 අතර මුදලක් වැය වීම, ආහාර සඳහා වියදම අධික වීම, ප්‍රමාණවත් පරිදි ආහාර සහ භාණ්ඩ නේවාසිකාගාර අවන්හල් තුළ නොමැති වීම, අවශ්‍ය මුදල් නොමැති විට යහළුවන්ගෙන් මුදල් ඉල්ලා ගැනීම, නේවාසිකාගාරයෙන් බැහැර ව නිවසට යාම, කුසගින්නේ සිටීම ආදිය සඳහා සිසුන් යොමු වන බවත් අනාවරණය විය. තමා විසින් ම රැකියාවක් කර අවශ්‍ය මුදල් සොයා ගනු ලබන්නේ 1%ක් තරම් සුළු පිරිසක් වීම, ආර්ථික අපහසුතා හේතුවෙන් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන කටයුතු අතර මග නවත්වන්නට සිතීම, නේවාසික ව රැඳී සිටීමට ප්‍රමාණවත් මුදලක් නොලැබීම සුවිශේෂී සොයා ගැනීම් අතර විය. ලබා දෙන ශිෂ්‍යාධාර මුදල වැඩි කිරීම, අධ්‍යාපනයෙහි නියැලෙනවාත් සමඟ අමතර රැකියාවන් සඳහා යොමු වීම හරහා ගැටලු වලක්වා ගැනීමට හැකි බව සිසුනගේ යෝජනා අතර විය. නේවාසික ව රැඳී සිටීමේ දී බොහෝ සිසුන් ආර්ථික ගැටලු මත පීඩාවන්ට පත් වන බව අවසාන නිගමනය වේ.

***ප්‍රමුඛ පද:*** නේවාසිකාගාර, විද්‍යාර්ථීහු, ආර්ථික, දුෂ්කරතා

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. lakshikasudarshanils@gmail.com